# අනුරාධපුර යුගයේදී ලංකාවේ පැවැති රාජ්‍ය උරුමය පිළිබඳ රීතිය

රණවැල්ල මහතා

අනුරාධපුර යුගයේදී ලංකාවේ පැවැති රාජ්‍ය උරුමය පිළිබඳ රීතිය සම්බන්ධයෙන් දැනට ඉදිරිපත් වී ඇති මත දෙකෙකි. මහාචාර්ය **ගයිගර්** මහතා ඉදිරිපත් කොට ඇති වැඩි මහලුකම අනුව සහෝදරයාගෙන් සහෝදරයාටත් ඊළඟට වැඩි මහලු සහෝදරයාගේ පුතුන්ටත්, ඔවුන්ගෙන් පසු ඊළඟ සහෝදරයාගේ පුතුන්ටත් ආදී වශයෙන් රජකම ක්‍රමයෙන් උරුම වූ බව කියන මතය ඉන් එකෙකි. අනික් මතය පළ කරන්නේ **ජෝන් එම්. සෙනෙවිරත්න** සහ **මහාචාර්ය ඇම්. බී. ආරියපාල** යන මහතුන් දෙදෙනාය. ඒ මහතුන් පළ කරන්නේ ඉන්දියාවේ මෙන් ලංකාවේත් පියාගෙන් පසු පුතාට රජකම උරුමවීමේ සිරිත පැවැති බවයි. අනුරාධපුර යුගයේදී රජකමට පත්වූ කුමාරවරුන් එකිනෙකා අතර පැවැති ඥාතිසම්බන්ධය පරීක්ෂා කිරීමෙනුත් වංසකථාවලින් හා සමකාලින සෙල්ලිපිවලින් ලැබෙන අනෙකුත් සාක්ෂ්‍ය සොයා බැලීමෙනුත් අපට මේ පිළිබඳ නිගමනයකට බැසිය හැකි ය.

ලංකාවේ මුල්ම රජ හැටියට මහාවංශයේ සඳහන් වන **විජය** රජු තමාට පුතකු නොවූ හෙයින් තමාගෙන් පසු ලංකා රාජ්‍යය බාර ගැනීම සඳහා මෙහි එන ලෙස දන්වා දඹදිව සිටි තම සොහොයුරු **සුමිත්ත** කුමරුට හසුන් පත් යැවූ බව මහාවංශයේ සඳහන් ව ඇති නමුත් ඒ වෙනුවට මෙහි ආවේ සුමිත්ත කුමරුගේ තෙවන පුතා වූ **පණ්ඩුවාසුදේව** කුමරු ය. පණ්ඩුවාසදේව රජුගෙන් පසු රජකම උරුම වූයේ ඔහුගේ වැඩි මහලු පුත් අභය කුමරුට ය.

ඊළඟට රජවූ **පණ්ඩුකාභය** කුමරු අභය රජුගේ සොහොයුරියගේ පුතෙකි. ඔහු රජවූ බව කියන්නේ තම මයිලන් කිහිප දෙනෙකුන් සමග සටන් කොට ඔවුන් පරදවා ලීමෙන් පසුවයි. පණ්ඩුකාභය රජුගෙන් පසු රජකම උරුම වූයේ ඔහුගේ පුත් මුටසීව කුමරුට ය. පණ්ඩුකාභය රජුට සොහොයුරකු නොවූ බව මහාවංශයෙන් හෙළිවේ. මුටසීවගෙන් පසුව රජ වූයේ ඔහුගේ දෙවන පුත් දේවානම්පියතිස්ස කුමරුය. එහෙත් මුටසීව රජුගේ වැඩි මහලු පුත්‍රයා වූ උද්ධ චූලාභය කුමාරයා එකල මහියංගණ ප්‍රදේශය පාලනය කළ බව මහාවංශ ටීකාවේ සඳහන් කොට ඇත. දේවානම්පියතිස්ස රජුගෙන් පසුව රජකම උරුම වූයේ ඔහුගේ මල් උත්තිය කුමරුට ය. උත්තිය කුමරුට රජකම හිමි වූයේ දෙවානම්පියතිස්ස රජුට පුතකු නොවූ නිසා යයි මහාවංශය සඳහන් කරයි. දෙවානම්පියතිස්ස රජුට ඇත්ත වශයෙන්ම පුතකු සිටි බව මහංවශයෙන් ම හෙළි වෙයි. එහෙත් රජුගේ අග බිසව තම පුතුට රජකම මතුවට හිමිකර දීමේ බලා

පොරොත්තුවෙන් එකල යුවරජුව සිටි මහා නාග කුමාරයා මැරවීමට ඇටවූ උගුලේ තම පුත්‍රයා පැටලීම නිසා ඒ පුත් කුමරුවාට අකාලයේ මිය යන්නට සිදුවිය. මෙහිදී මතුවන ප්‍රශ්නය නම්; දේවානම්පියතිස්ස රජුගේ අගබිසවයේ පුතුට රජුගෙන් පසු ඒකාන්තයෙන්ම රාජ්‍යය උරුම වන්නට තුබුණා නම් යුවරජු මැරවීමට අග බිසව පෙළඹුණු කාරණය කුමක් දැයි විමසා බැලීමයි.

උත්තිය රජුගෙන් පසු ඔහුගේ බාල සොහොයුරන් තිදෙනා වූ මහාසිව, සූරතිස්ස අසේල යන කුමාරවරුන් තිදෙනාට පිළිවෙළින් රාජ්‍යය උරුම විය. එහෙත් මෙහිදී උත්තිය රජුගෙන් පසු මහාසිව කුමරුට රාජ්‍යය උරුම වූයේ උත්තිය රජුට පුතුන් නොසිටි නිසා ය යි මහාවංශය සඳහන් නො කරයි. උත්තිය රජුගේ පුතකු ගැන මහාවංශයේ සඳහන්ව නැතත් ඔහුගේ පුතකු ගැන මහාවංශ ටීකාවේ සඳහන් වී ඇත. එහි ඔහුගේ නම සඳහන් කොට නැතත් ඔහු කැලණියේ කැලණිතිස්ස රජුගේ පියා බව දක්වා ඇත. මහාසිව රජුගෙන් පසු ඔහුගේ සොහොයුරු සූරතිස්සයන්ට රජකම උරුම වූයේත් සූරතිස්සයන්ගෙන් පසු ඔහුගේ බාල සොහොයුරු අසේල කුමරුට රජකම උරුම වූයේත් ඔවුන් දෙදෙනාටම පුතුන් නොසිටි නිසා යයි පිළිගැනීම තරමක් උගහට ය.

අසේල රජුගේ කාලයේ ඇතිවූ ද්‍රවිඩ ආක්‍රමණයක් නිසා අනුරාධපුරයේ ප්‍රධාන රාජවංසය එතැනින් කෙළවර වෙයි. ඊළඟට නැවතත් අනුරාධපුරයේ රජකමට පත් වන්නේ රුහුණින් ආ දුටුගැමුණු රජු ය. මේ රජුගේ පරම්පරාවේ රජවරුන් රුහුණේ රජකමට පත්වූ අනුපිළිවෙළ මහාවංශයේ දී තිබේ. ඒ අනුව එහි ආරම්භකයා දේවානම් පියතිස්ස රජුගේ බාල සොහොයුරකු වූ මහානාග නම් යුවරාජයා ය. මහා නාග ගෙන් පසු ඔහුගේ පුත් යටාලතිස්ස කුමරුත් යටාලතිස්සගෙන් පසු ඔහුගේ පුත් ගෝඨාභය කුමරුත්, ගෝඨාභයගෙන් පසු ඔහු පුත් කාවන්තිස්ස කුමරුත් ඊළඟට කාවන්තිස්ස රජුගේ පුත් දුටුගැමුණු කුමරුත්, පිළිවෙළින් රජ වූ බව එහි සඳහන් වෙයි. ගෝඨාභය කුමරු යට්ටාලක තිස්ස රජුගේ පුතා බව මහාවංශයෙහි සඳහන් වී ඇතත් මඩකලපු දිස්ත්‍රික්කයේ කුසලාන කන්ද නම් ස්ථානයෙන් ලැබුණු සෙල්ලිපියකින් හෙළිවන්නේ ඔවුන් දෙදෙනා සොහොයුරන් බවයි.

දුටුගැමුණු රජුගේ මව වූ කැලණියේ විහාරමහාදේවියගේ පරම්පරාවේ ඉතිහාසයත් මහාවංශයේ ඇත. ඒ අනුව කැලණියේ මුල් පාලකයා අප කලින් කී පරිදි අනුරාධපුරයේ උත්තිය රජුගේ පුතෙකි. ඊළඟට එහි රජවූයේ උත්තිය රජුගේ පුතාගේ පුතෙක් වූ කැලණිතිස්ස කුමරු ය. විහාර මහා දේවිය ඒ කැලණිතිස්ස රජුගේ දුවය.

දුටුගැමුණු රජුගෙන් පසු අනුරාධපුරයේ රජකම උරුම වූයේ ඔහුගේ මල් සද්ධාතිස්ස කුමරුට ය. ඔහුට රජකම හිමිවූයේ දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමාරයා "රජකමට වඩා අශෝකමාලා දේවිය අගය කළ නිසා" බව මහාවංසය පවසයි. සාලිය රාජකුමාරයා රජකම ප්‍රතික්ෂෙප කිරීම නිසා සද්ධාතිස්ස කුමරුට රජකම හිමි වූ බව කියන මේ පුවතත්, දේවානම්පියතිස්ස රජුට පුතුන් නොවූ නිසා උත්තිය කුමරුට රජකම උරුම වූ බව කියන කථාවත් විජය රජු තමන් ගෙන් පසු රාජ්‍යය භාර ගැනීමට තමාගේ පුතකු නොවූ නිසා සොහොයුරාට රජකම බාරගැනීමට එන ලෙස කියා හසුන් පත් යැවූ බව කියන පුවතත් පමණක් සාක්ෂ්‍ය හැටියට ගත හොත් අපට තීරණය කරන්නට සිදුවන්නේ පියාගෙන් පසු පුතාටත් පුතුන් නැති වූ විටෙක පමණක් සොහොයුරන්ටත් රජකම උරුම වීමේ සිරිතක් එකල ලංකාවේ පැවැති බවයි. එහෙත් නියම වශයෙන් අනුරාධපුරයේ රජකමට පත් කුමාරවරුන්ගේ

ඥති සම්බන්ධය පරීක්ෂා කර බලන විට එවැනි සිරිතක් තුබූ බව නො පෙනේ. එකල පැවතුණේ පියාගෙන් පුතාට රජකම උරුම වීමේ සිරිත නම් උත්තිය රජුගෙන් පසු රජකම උරුම විය යුතුව තුබුණේ ඔහුගේ පුතුට ය. එමෙන් ම මහාසිවගෙන් පසු ඔහුගේම පුත්‍රයාටත් රජකම හිමිවිය යුතුව තිබුණි. මහාසීව හා සූරතිස්ස යන රජුන් දෙදෙනාගේ පුතුන් ගැන මහාවංසයේ සඳහන් නොවුණු පමණින් ම ඔවුන්ට එක පුතකුවත් හිටියේ නැතැයි කියා තීරණය කළ නො හැකි ය.

අපේ රාජාණ්ඩු ක්‍රමය අපට ලැබුණේ උතුරු ඉන්දියාවෙන් නිසා අපේ රජපරපුර ආරම්භයේදී එකල ඉන්දියාවේ පැවැති පියාගෙන් පුතාට රජකම උරුම වීමේ සිරිත මෙහිද පවතින්නට ඇතැයි සිතිය හැකි නමුත් පසුව අපටම ආවේණික වූ රාජ්‍යඋරුමය පිළිබඳ සිරිතක් මෙහි ඇතිවූ බවයි ඉහත සාක්ෂ්‍ය අනුව අපට නිගමනය කරන්නට සිදුවී ඇත්තේ. දුටුගැමුණු රජුගෙන් පසුව අනුරාධපුර යුගයේ මුල හරියේ රජකම් කළ රජවරුන් එකිනෙකා අතර පැවැති ඥතිසම්බන්ධයත් අනුරාධපුර යුගයේ අවසාන හරියේ රජකළ රජවරුන් එකි-නෙකා අතර පැවැති ඥතිසම්බන්ධයත් පරීක්ෂා කර බැලීමෙන් අපට මේ පිළිබඳව නිගමනයකට බැහීමට පිළිවන් විය හැකි නිසා මීළඟට අපි ඒ රජවරුන් ගැන විමසා බලමු.

දුටුගැමුණු රජුගේ මරණයෙන් පසු ඔහුගේ මල් සද්ධාතිස්ස කුමාරයා රජකමට පත්වූ බව අප කලින් සඳහන් කරන ලදී. සද්ධාතිස්ස රජුගෙන් පසු රජකම උරුම වූයේ ඔහුගේ පුතුන් හතර දෙනාට යි. අන්තිමට රජවූයේ ඔහුගේ බාල පුතා වූ වළගම්බා කුමරුයි. එකල පැවැතියේ පියාගෙන් පුතාට රජකම උරුම වීමේ සිරිත නම් රජකම උරුම විය යුතුව තුබුණේ සද්ධාතිස්ස රජුගේ වැඩිමල් පුතා වූ ලජ්ජිතිස්සගේ පුතකුට හෝ දෙවැනි පුත්‍රයා වූ ථූලත්ථනගේ පුතකුට යි. ඒ දෙදෙනාට ම පුතුන් නොසිටියේ නම් තුන් වැනි පුතාවූ ඛල්ලාටනාග රජුගේ පුතකුටයි. වළගම්බා රජුගේ මරණයෙන් පසු රජකම උරුම වූයේ ඔහුගේ පුතුට නොව ඔහුගේ වැඩිමල් සොහොයුරු ඛල්ලාටනාග රජුගේ පුත්‍රයකු වූ මහා චූළි මහාතිස්ස කුමරුටයි. වළගම්බා රජුගේ පුත්‍ර චෝරනාග කුමරු රජවූයේ ඉන් පසුව ය. ඉක්බිති රජවූවෝ මහා චූළි මහාතිස්ස රජුගේ පුතුන් දෙදෙනාවූ තිස්ස හා කුටකණ්ණ අභය යන කුමාරවරු දෙදෙනාය. සද්ධාතිස්ස පරම්පරාවේ අව-සාන පාලකයාවූ යසලාලකතිස්ස රජු දක්වා ක්‍රමයෙන් අනුරාධපුර රාජ්‍යය උරුම වී ඇත්තේ වැඩි මහලු පිළිවෙළ අනුව සහෝදරයාගෙන් සහෝදරයාට යි.

අනුරාධපුර යුගයේ අවසාන හරියේදී ද පැවතුණේ මේ සිරිත ම බවට චූළවංස-යෙන් හා සෙල්ලිපිවලින් සාක්ෂ්‍ය ලැබේ. මානවම්ම පරපුරේ රජවරුන් එකිනෙකා අතර පැවැති ඥාතිසම්බන්ධය පරීක්ෂා කිරීමෙන් මේ බව පැහැදිළි වෙයි. මේ වංසයේ රජවරුන් කිහිපදෙනෙකුන්ම රජකමට පත්වූ අවස්ථාවලදී ඔවුන් එසේ පත්වූයේ ක්‍රමාගතව බව චූළවංසය අවධාරණයෙන් ම සඳහන් කරයි. වැඩි මහලු පිළිවෙළ උල්ලංඝනය කොට රජකමට පත්වූ අවස්ථාවලදී ඒ පත්වීම ක්‍රමවිරෝධී බවත් චූළවංසය දක්වයි. මේ වංසයට අයත් iv දප්පුල රජුගේ සෙල් ලිපියක ඒ වංශයේ ''පිරිමින් වැඩි මහලු පිළිවෙළ නොඉක්මවූ'' බව සඳහන් කරයි. මේ පරම්පරාවේ ආදිමයාවූ මානවම්ම රජුගෙන් පසු වැඩි මහලු පිළිවෙළ අනුව ඒ රජුගේ පුතුන් තුන්දෙනාවූ v අග්ගබෝධි iii කස්සප i මහින්ද යන කුමාරවරු රජ බවට පත්වූහ. v වැනි අග්ගබෝධි රජුට පුතුන් නොවූ නිසා ඊළඟට පිළිවෙළින් රජවූයේ තුන් වැනි කස්සපගේ හා i මහින්දගේ පුතුන් වූ vi අග්ගබොධි හා vii අග්ග

බොධි යන කුමාරවරුන් ය. vii අග්ග බෝධිගෙන් පසු රජකම උරුම වූයේ ඔහුගේ වැඩිමහලු සොහොයුරු vi අග්ග බොධිගේ පුත් ii මහින්ද කුමාරයාට ය. ii මහින්දගේ ඇවෑමෙන් ඔහුගේ පුත් i උදය රජුටත්, ඉන්පසු i උදය රජුගේ පුතුන් තිදෙනාටත් වැඩිමහලු පිළිවෙළ අනුව රජකම උරුම විය. i උදය රජුගේ වැඩි මහලු පුත්‍රයා වූ iii මහින්ද රජුගේ පුත් මහින්ද කුමාරයාට ඊළඟට ඔටුන්නට හිමිකම් තුබුණු නමුත් ඔහුගේ සුළු පියාවූ ii දප්පුල රජු "සිය පුතුන්ට රජය පත් කරනු පිණිස" ඒ මහින්ද කුමාරයා ආදිපාද තනතුරට පත් නොකරන ලද බව චූළ වංසය සඳහන් කරයි. එම නිසා ඊළඟට රාජ්‍යය උරුම වූයේ ii දප්පුල රජුගේ පුතුන්ටයි. ඔහුට පුතුන් පස් දෙනෙකුන් සිටි නමුත් එයින් මහින්ද, කස්සප, උදය යන කුමාරවරු තිදෙන ඔවුන්ගේ වැඩිමහලු සොහොයුරන්ට කලින් මියගියහ. එමෙන් ම ඔහුගේ වැඩිමල් පුතුන් තිදෙනාගෙන් එක් අයකුටවත් පුතෙක් සිටියේ නැත. එම නිසා ඊළඟට රාජ්‍යය උරුම වූයේ කස්සප නම්වූ ආදිපාදයන්ගේ පුතුන්වූ ii සේන ii උදය iv කාශ්‍යප යන කුමාරවරුන්ට යි.

ii සේන රජු ළඟට මහින්ද නම්වූ තවත් පුතකු සිටි නමුත් රජුට කලින් ඔහු මිය ගිය නිසා ඊළඟට රජය උරුම වූයේ ii උදය රජුට යි. iv කාශ්‍යප රජ වූයේ ඉන් පසුව යි. iv කාශ්‍යප රජුගෙන් පසු රජකම උරුම වූයේ ඔහුගේ වැඩිමහලු සොහොයුරු ii සේන රජුගේ පුතුන්වූ v කාශ්‍යප iii දප්පුල iv දප්පුල යන කුමාරවරුන්ට ය. ඊළඟට රජකම උරුම වූයේ ii සේන රජුගේ සොහොයුරු මහින්ද කුමාරයාගේ පුතකු වූ iii උදය කුමරුටය. ඉන්පසු ii සේන රජුගේ ඊළඟ සොහොයුරුවූ ii උදය රජුගේ පුත් iii සේන කුමරු රජවිය. ඔහුගෙන් පසුව ii සේන රජුගේ බාල සොහොයුරු iv කාශ්‍යප රජුගේ පුත් iv උදය රජකමට පත් විය. ඊළඟට නැවතත් රජකම උරුමවන්නේ වැඩිමහලු පිළිවෙළ අනුව ii සේන රජුගේ පුත්‍රයකුවූ iii දප්පුල රජුගේ පුතකුට ය. ඒ iv සේන රජු ය. ඔහුගෙන් පසු රජකම උරුම වූයේ ii සේන රජුගේ සොහොයුරු මහින්ද කුමරුගේ පුතකුවූ iii උදය රජුගේ පුත් iv මහින්ද කුමාරයාට ය. iv මිහිඳු රජුට කිත්තග්ගබොධි නම් සොහොයුරකු සිටි නමුත් ඔහු රජවීමට කලින් මිය ගොස් ඇති නිසා ඊළඟව රජකම උරුම වූයේ iv මිහිඳු රජුගේ පුතුන් වූ v සේන හා v මිහිඳු යන කුමාරවරුන් දෙදෙනාට ය. පස්වැනි මිහිඳුගෙන් පසු අනුරාධපුර රාජධානිය බිඳ වැටුණි.

මානවම්ම පරපුරේ රජවරුන් අතර පැවැතියේ වැඩිමහලු පිළිවෙළ අනුව සහෝදරයාගෙන් සහෝදරයාටත් ඉන්පසු වැඩිමහලු සහෝදරයාගේ පුතුන්ටත්, ඊළඟට ඊළඟ සොහොයුරුගේ පුතුන්ටත් ආදී වශයෙන් ඔටුන්න උරුම වීමේ ක්‍රමයක් බව මේ තොරතුරු වලින් හෙළි වේ. මානවම්ම පරම්පරාවට කලින් අනුරාධපුරයේ රජකළ වසභ රජුගේ පරම්පරාවේ රජුන් අතරත් පැවතුණේ මේ සිරිත ම බවයි පෙනී යන්නේ. මෙතෙක් ඉදිරිපත් කළ සාක්ෂ්‍ය අනුව අනුරාධපුර යුගය ආරම්භයේදී පියාගෙන් පසු පුතුට රාජ්‍යය උරුමයයි පිළිගැනීමක් තුබුණු නමුත් පසුව අපට ම ආවේණික වූ රාජ්‍ය උරුමය පිළිබඳ චාරිත්‍රයක් වූ සොහොයුරුගෙන් සොහොයුරාට රාජ්‍යය උරුම විය යුතුය යන්න මෙහි රීතියක් වශයෙන් පිළිගෙන තුබුණු බව නිගමනය කළ යුතුය. ඒ නිසා ජෝන් එම්. සෙනෙවිරත්න හා මහාචාර්ය එම්. බී. ආරියපාල යන මහතුන්ගේ මතය අනුරාධපුර යුගයේ මුල් ශතවර්ෂ කිහිපය සම්බන්ධයෙන් පමණක් නිවැරදි බවත් සොහොයුරාගෙන් සොහොයුරාට රාජ්‍යය උරුම වූ බව කියන මහාචාර්ය ගයිගර් මහතාගේ මතය අනුරාධපුර යුගය සමස්තයක් වශයෙන් ගෙන සලකන විට බොහෝ දුරට නිවැරදියයිද අපට නිගමනය කරන්නට පුලුවන.